# ආගම්වලට හැරවීම හා බිෂොප්වරු

බලාපොරොත්තු වූ පරිදි ම ශ්‍රී ලංකා රදගුරු සම්මේලනය හා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරමින් ආගම්වලට හරවා ගැනීම තහනම් කරන පණත් කෙටුම්පතට තම විරුද්ධත්වය පළකර ඇත. සදාචාරාත්මක නොවන ආගම්වලට හැරවීම් මෙරට කාලයක් තිස්සේ කෙරීගෙන යන බව පිළිගන්නා සම්මේලනය හා මණ්ඩලය ඒ ගැටළුවට මුහුණදීම සඳහා එක්සත්ව ක්‍රියා කළයුතු බව පවසයි. එහෙත් ඒ කුමක් දැයි නොකියයි. එය හිස් වචන ටිකක් පමණකි. නීති මගින් මේ ක්‍රියා නැවැත්විය නොහැකි බව ද ඔස්වල්ඩ් ගෝමස් බිෂොප්වරයා ප්‍රමුඛ පිරිස කියා සිටිති.

ඒ අවසාන අදහස සමග නම් මම ද එකඟවෙමි. මිනිසුන් ක්‍රිස්තියානි නිකායකට හැරවීම කිසි දිනෙක මෙරට බලපවත්වන නීතියෙන් නම් වැළැක්විය නො හැකි ය. එයට හේතුව නීතිය ද ක්‍රිස්තියානි වීම ය. රෝම ලන්දේසි නීතිය ක්‍රියාත්මක වනුයේ රටවල් දෙකක යැයි කියැවෙයි. ඒ රටවල් නම් ලංකාව හා දකුණු අප්‍රිකාව ය. අපට රෝම ලන්දේසි නීතිය ලැබුණේ දුටුගැමුණු රජතුමාගෙන් නො වෙයි. ඒ ලැබුණේ රෙපරමාදු ආගම අදහන ලන්දේසීන්ගෙන් ය. ක්‍රිස්තියානි නීතියක් උපයෝගී කරගනිමින් මිනිසුන් ක්‍රිස්තියානියට හැරවීම ඇතැම්විට ටික කාලයකට අඩපණ කිරීමට හැකිවනු ඇත. එහෙත් වැඩිකල් නොගොස් ඒ නීතිය හරහා ම ක්‍රිස්තියානියට හැරවීම පෙරටත් වඩා කාර්යක්‍ෂම ව කෙරෙනු ඇත. ගෝමස් බිෂොප්වරයා ඇතුළු පිරිස කලබලයට පත්වන්නේ ඒ ටික කාලය ගෙවාගන්නේ කෙසේ ද යන්න ගැන සිතීමෙන් ය.

පණතින් ආගමික නිදහස නැතිවේයැයි කියමින් ඊනියා ප්‍රජාතන්ත්‍රවාදයක් ගැන සඳහන්කිරීමට ඉහත සඳහන් සම්මේලනය හා මණ්ඩලය පෙරට පැමිණ ඇත. මේ රටේ දැනට ඇති ආගමික නිදහස බටහිර රටවල් ද ඇතුළු බොහෝ රටවල නැති බව බොහෝ දෙනා නො දනිති. මෑතක දී ප්‍රංශයේ මුස්ලිම් ශිෂ්‍යාවෝ ඔවුන්ගේ සංස්කෘතියෙන් ඔවුන්ට නියමිත ව ඇති දිග සායක් වැනි ඇඳුම ඇඳ මොට්ටැක්කුලියකින් මුහුණ වසාගෙන පාසල් එමට පටන්ගත්හ. ප්‍රංශ ආණ්ඩුව එහි දී මැදිහත් වී කිසිම ආගමික සංකේතයක් සහිත ඇඳුම් පාසලට ඇඳීම තහනම් කෙළේ ය. මෙය කිසිම ආගමකට පක්‍ෂපාතිවී ගත් තීරණයක් නොවන බව බටහිර දේශපාලන විද්‍යාඥයන්ගේත්, සමාජ විද්‍යාඥයන්ගේත් අනෙක් බටහිර උගතුන්ගේත් මෙරට අනුකාරකයන්ගේත් මතය වෙයි. (මෙරට අනුකාරකයන්ට ස්වාධීන මතයක් නැති බව ද සඳහන් කළ යුතු ය.) බැලූ බැල්මට එය එසේ වන නමුදු ප්‍රායෝගික වශයෙන් ගත්කල සිදුවන්නේ කුමක් දැයි තේරුම්ගැනීම අනුකාරකයකුට වුව ද එතරම් අපහසුවක් නැත.

ප්‍රංශය ආගමික වශයෙන් ගත්කල කතෝලික රටකි. එහෙත් අනෙක් රටවල මෙන් ම එහි ද අද බලපවත්වන්නේ රෙපරමාදු නැත්නම් ප්‍රොතෙස්තන්ත සංස්කෘතියයි. බලපවත්වන්නේ යන්නෙහි තේරුම බලය පවත්වාගෙන යන්නේ යන්න ය. අද ප්‍රංශය ද ඇතුළු බටහිර රටවල පමණක් නොව ලංකාවේ ද අධිපතිවාදී සංස්කෘතිය වන්නේ ප්‍රොතෙස්තන්ත සංස්කෘතිය ය. ඉනුදු ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතිය ය. ප්‍රංශයේ ක්‍රිස්තියානි හෝ බහුතරය වන කතෝලික ශිෂ්‍යාවෝ විශේෂ ආගමික  ඇඳුමක් නාඳින බව සාමාන්‍ය මතය වෙයි. එය මුළුමනින් ම වැරදි මතයකි. ප්‍රංශයේ ස්ත්‍රීන් පල්ලියට යන විට අඳින ඇඳුම කුමක් ද? ඒ ඇඳුම ඔවුන් කාර්යාලයට අඳින ඇඳුමෙන් හා සාමාන්‍ය ඇඳුමෙන් වෙනස් නොවන්නේ නම් ඉන් කියැවෙන්නේ ප්‍රංශයේ සමාන්‍ය ඇඳුම පල්ලියට අඳින ඇඳුම ම බව ය. ප්‍රංශයේ සංස්කෘතිය ක්‍රිස්තියානිවීම නිසා එහි නිල ඇඳුම්, සාමාන්‍ය ඇඳුම් ආදී සියල්ල ක්‍රිස්තියානි සංස්කෘතියේ ඇඳුම් වෙයි.

ක්‍රිස්තියානි සංස්කෘතියේ ඇඳුම් සාමාන්‍ය ඇඳුම් බවට පත්වී ඇති විට පාසලට සාමාන්‍ය ඇඳුමෙන් පමණක් සැරසී එන ලෙස නියෝග කළවිට සිදුවන්නේ මුස්ලිම් සිසුන් ද ක්‍රිස්තියානි සංස්කෘතියේ ඇඳුම් ඇඳගෙන පාසලට පැමිණීම ය. ප්‍රංශය ආගමික ඇඳුමෙන් පාසල් එම ශිෂ්‍යාවන්ට තහනම් කරන්නේ ක්‍රිස්තියානි ඇඳුම සාමාන්‍ය ඇඳුම බවට පත්වී ඇති විට ය. දැන් ප්‍රංශයේ ක්‍රිස්තියානි ඇඳුම් යනුවෙන් විශේෂ ඇඳුම් නැත. විශේෂය අද එහි සාමාන්‍යය බවට පත්වී ඇත. ප්‍රංශය පාසලට ආගමික ඇඳුම් ඇඳගෙන එම තහනම් කළවිට සිදු වූයේ සියල්ලන්ටම සාමාන්‍ය ඇඳුමෙන් සැරසී එමට නියෝගකිරීම ය. සාමාන්‍ය ඇඳුම යනු ක්‍රිස්තියානි ඇඳුම බැවින් ඉන් සිදුවූයේ මුස්ලිම් ශිෂ්‍යාවන්ට ද ක්‍රිස්තියානි

© Prof. Nalin De Silva

ඇඳුමෙන් පාසල් එමට බලකිරීම ය. එහෙත් බොහෝ දෙනාට එය නො තේරෙයි. ඔවුන් සිතන්නේ ප්‍රංශය කාටත් සමාන ව සැලකීමට පාසලින් ආගමික ඇඳුම් තහනම්කළ බව ය.

මෙරට බෞද්ධ රටක් වී ඇත්තේ නාම මාත්‍රික ව පමණ ය. ලංකාව සංස්කෘතික වශයෙන් ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි වෙයි. අපේ පාර්ලිමේන්තුව පිහිටුවා ඇත්තේ ඒ සංස්කෘතියෙහි මිස බෞද්ධ සංස්කෘතියක නො වෙයි. හාමුදුරුවන් පාර්ලිමේන්තු වැඩම කිරීමෙන් වී ඇත්තේ එක් පැත්තකින් සිංහල බෞද්ධ සම්ප්‍රදායෙන් පිටපැනීමකි. අනෙක් පැත්තෙන් උන්වහන්සේලා ද ක්‍රිස්තියානි සංස්කෘතියෙහි සිරකරුවන් වීමකි. මෙරට අධ්‍යාපනය මුළුමනින් ම ක්‍රිස්තියානි වෙයි. අපට සිංහල බෞද්ධ සංස්කෘතියක නිර්මාණය වූ යමක් ශිෂ්‍යයන්ට ඉගැන්වීමට ඇති ඉඩකඩ ඉතා අල්ප ය. අද ඉගැන්වෙන ගණිතය පමණක් නොව දේශපාලන විද්‍යාව ආර්ථික විද්‍යාව ආදිය ද ක්‍රිස්තියානි වෙයි. එපමණක් නො වෙයි. බුද්ධාගම ද ඉගැන්වෙන්නේ ක්‍රිස්තියානි සංස්කෘතික දෘෂ්ටි කෝණයකින් ය. බුද්ධාගම, බුද්ධාගම ලෙස ගැනීම ම ක්‍රිස්තියානි වෙයි. මේ ක්‍රිස්තියානි අධ්‍යාපනයට එරෙහි ව කටයුතු කිරීම සියදිවි නසාගන්නා වැඩක් බව මම අත්දැකීමෙන් දනිමි. මා කොළඹ විශ්ව විද්‍යාලයෙහි ක්‍රිස්තියානි ගණිතය උගන්වන අතර එය විවේචනය කිරීම බොහෝ දෙනාට නුරුස්සන දෙයක් විය. ඕල්කට් බෞද්ධයෝ ද එයට විරුද්ධ වූහ. ඕල්කට් බෞද්ධයෝ සංස්කෘතියෙන් ක්‍රිස්තියානි වෙති. මගේ විවේචන නොරිස්සුවෝ මා ගණිතය නුගන්වන බවට මතයක් ප්‍රචාරය කළහ. අද ද ජාතික හෙළ උරුමයේ ඇතැම් අනුගාමිකයෝ ඕස්ට්‍රේලියාවේ සිට යවන ඉලෙක්ට්‍රොනික තැපෑලෙන් මා එදා විශ්ව විද්‍යාලයේ ගණිතය නුගැන්වූ බවට චෝදනා කරති! අවුරුදු තුන හතරක් ගතකර විශ්ව විද්‍යාලයක ඉගෙන ගැනීමට තරම් දෙයක් නැතැයි යන්න ශිෂ්‍යයකු ලෙස පවා මට අවබෝධ වී තිබුණු කරුණකි. එබැවින් කාල සටහනෙන් මට වෙන්කර ඇති කාලයෙන් යම් ප්‍රමාණයක් මම දේශීය දැනුමක් ශිෂ්‍යයන්ට ලබාදීමට යොදාගත්තෙමි. දැනුදු යොදා ගන්නෙමි. එහෙත් මම බටහිර ගණිතය ද උගන්වන්නෙමි.

කෙසේ වෙතත් මා ඉගැන්වූ දේ ගැන මනාපයක් නොතිබූ එවක උපකුලපති ව සිටි ජී එල් පීරිස් මහතා මා කැඳවා ප්‍රශ්න කෙළේ මා ජාතික චින්තනය උගන්වන්නේ ඇයි ද කියා ය. මට ඔහුට දීමට තිබුණේ එකම එක පිළිතුරකි. මා ඔහුට කියා සිටියේ අනෙක් සියල්ලන්ට විජාතික චින්තනය ඉගැන්වීමට හැකිනම් මට ජාතික චින්තනය ඉගැන්වීමට අයිතියක් ඇති බව ය. එහෙත් කොළඹ විශ්ව විද්‍යාලය ඉන් නොබෝ කලකින් මට ඒ අයිතිය නැති බව තීරණය කෙළේ ය. ඒ තීරණය ගත් පාලක සභාවෙහි ඔස්වල්ඩ් ගෝමස් බිෂොප්වරයා ද විය. අද ඔහු කොළඹ විශ්ව විද්‍යාලයෙහි කුලපති වෙයි. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව මා විශ්ව විද්‍යාලයක ඉගැන්වීමට සුදුස්සකු බව තීරණය කර තිබෙද්දීත් අද පවා කොළඹ විශ්ව විද්‍යාලය මට එහි නිල දේශනයක් නොව ශිෂ්‍ය සංගමයක දේශනයක් පැවැත්වීමටවත් අවසර නොදෙයි. ඒ එහි උපකුලපතිවරයාගේ තීරණයක් නිසා බව කියැවෙයි. විශ්ව විද්‍යාලයෙහි කුලපතිවරයා මේ ගැන නොදන්නවා විය හැකි ය. දැනගත්ත ද ඔහුට ඒ සම්බන්ධයෙන් නිල වශයෙන් කළ හැකි දෙයක් නොමැති බව ද මම දනිමි. මේ සම්බන්ධයෙන් කොළඹ විශ්ව විද්‍යාලයෙහි ගුරුවරු හා සිසුහු ද නිහඬ වෙති. මා සේවයෙන් නෙරපා දැමූ විට කොළඹ විශ්ව විද්‍යාලයෙහි ක්‍රිස්තියානි සංස්කෘතිය වෙනුවෙන් පෙනී සිටින ඊනියා මානව අයිතීන් ගැන කතාකරන ජයදේව උයන්ගොඩ වැනි අය ද ඕල්කට් බෞද්ධයෝ ද එදා ද අඩුම තරමින් මා සාමාජිකත්වය දැරූ වෘත්තීය සමිති ඉදිරියේ මට කරුණු පැහැදිලිකිරීමට අවස්ථාවක් පවා ලබා නො දුන්හ. මේ සියල්ලෙන් මා කීමට අදහස් කරන්නේ මෙරට ඇති අධ්‍යාපන නිදහස ගැන ය. අධ්‍යාපනය ද සංස්කෘතියෙහි ම කොටසක් වෙයි. අනෙක් රටවල මෙන් ම මෙරට ද බලපවත්වන්නේ ඇංග්ලො සැක්සන් ක්‍රිස්තියානි සංස්කෘතියකි. මෙරට ඇත්තේ බිෂොප්වරුන්ගේ ජී එල් පීරිස්ලාගේ උයන්ගොඩලාගේ හා වික්ටර් අයිවන්ලාගේ ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයකි.

ආගම්වලට හැරවීම් පිළිබඳ පණතින් මහා දෙයක් වේ යැයි මම නො සිතමි. එහෙත් තිබෙන ඉඩකඩ යොදාගනිමින් සුළු දෙයක් හෝ කිරීමෙහි වරදක් නැත. අප සියළු දෙනාම සංස්කෘතියෙන් ක්‍රිස්තියානි කිරීමේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදයක් පවතින බව පමණක් අපි තේරුම් ගතයුතු වෙමු. බෞද්ධයන් හා හින්දූන් පමණක් නොව කතෝලිකයන් ද ක්‍රිස්තියානි ආගමට හරවන්නේ මෙහි කොටසක් ලෙස ය.අද සාමාන්‍යය බවට පත්වී ඇත්තේ ක්‍රිස්තියානි සංස්කෘතියයි. ආගම්වලට හැරවීම පිළිබඳ පණතින් මේ ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයට එරෙහිව සුළු වශයෙන් හෝ පියවරක් ගැනෙයි. බිෂොප්වරු හා විවිධ ක්‍රිස්තියානි පල්ලි එයට විරුද්ධවන්නේ එබැවින් ය.

© Prof. Nalin De Silva